මතුගම ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 **මතය වියාචනය**

මතුගම ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය , ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ,මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

1.2 වියාචනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වියාචනය කළ මතයක් පළ කරනු ලැබේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ 1.6.2 ඡේදයේ (අ), (ආ) සහ (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගිණුම්කරණ ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.7 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් පිළියෙල කළ අයවැය ලේඛනවල අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ආ)	ගිණුම්කරණ ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.6 ඡේදය ප්‍රකාරව ප්‍රවර්තන මූල්‍ය ප්‍රකාශන කාල පරිච්ඡේදයේ ඉදිරිපත් කර ඇති සියළු වටිනාකම් සඳහා පෙර වූ සමාන කළ හැකි කාල පරිච්ඡේදය සම්බන්ධව තුලනාත්මක තොරතුරු අස්ථිත්වය විසින් හෙළිදරව් කළ යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී එපරිදි කටයුතු කර නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	ගිණුම්කරණ ප්‍රමිතියේ 3 වන පරිච්ඡේදයේ 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර නොතිබුණි.	2025 මුදල් ප්‍රවාහය සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මුදල් ප්‍රවාහය පිළියෙල කළ යුතුය.
(ඈ)	ගිණුම්කරණ ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදයේ 6.13 ඡේදය ප්‍රකාරව වත්කමක් භාවිතය සඳහා ලබා ගත හැකි අවස්ථාවේ සිට ක්ෂය කළ යුතු වුවත් පෙර වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂය සඳහාත් ස්ථාවර වත්කම් ක්ෂය කර නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය.
(ඉ)	ගිණුම්කරණ ප්‍රමිතියේ 9 වන පරිච්ඡේදයේ 9.6 ඡේදය ප්‍රකාරව දේපල , පිරියත සඳහා වන රජයේ පැවරුම්වලට අදාලව ක්ෂය කළ ප්‍රමාණයට සමාන ප්‍රමාණයක් 2020 වර්ෂයේ සිටම ආදායමට හඳුනාගත යුතු වුවද, සභාව එම ගැලපුම් සිදු කර නොතිබීමෙන් වර්ෂයේ ආදායම නිවැරදිව දක්වා නොතිබුණි.	-එම-	-එම-

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණය වෙනුවෙන් ලද රු.100,111,630 ක් රු.99,387,768 ක් ලෙස ගිණුම්ගත කිරීමේ වරද මෙම වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ආ)	ඉකුත් වර්ෂයේ රු.2,461,134 ක් වූ ලංකා බැංකු ගිණුම් ශේෂය රු.2,695,092 ක් ලෙස දක්වා තිබීමේ වරද මෙම වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.	-එම-	-එම-
(ඇ)	2019 වර්ෂයේ මිලදී ගත් රු.110,000 ක පාලම් කොඩි 20 ක් කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කිරීමේ වරද මෙම වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි.	-එම-	-එම-
(ඈ)	මුද්දර ගාස්තු ආදායමින් හිලව් කිරීමේ පදනමට 2018 වර්ෂයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලබාදුන් රු.12,000,000 ක් වූ කම්පැක්ටර් රථයේ වටිනාකම ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබීයදීත් තවදුරටත් ගෙවිය යුතු රු.643,875 ක් ජංගම නොවන වගකීම් යටතේ මෙන්ම ජංගම නොවන ආයෝජන යටතේද දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් රු.643,875 ක් වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	-එම-
(ඉ)	කර්මාන්ත ණයහිමි රු.2,736 ක් හර කිරීම වෙනුවට විවිධ ණයහිමි රු.573,780 ක් හර කර ලෙජර්වලට ගැලපුම් කිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් සහ සමුච්චිත අරමුදල පිළිවෙලින් රු.571,044 ක් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.	ජර්නල සටහනේ මුද්‍රණ දෝෂයක් බව.	ජර්නල් සටහන් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඊ)	ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.413,750 ක් ලෙජර ගිණුම්වලට ගලපා නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ජර්නල් සටහන් ගිණුම්වලට නිවැරදිව ගැලපිය යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පත් පොලී ආදායම රු.1,409,871 ක් විය යුතු වුවද, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,493,130 ක් ලෙස දක්වා තිබුණෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.83,259 ක් වැඩියෙන් දක්වා තිබුණි.	-එම-	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඌ)	බැංකු ජංගම ගිණුමට අදාලව 2024 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු.4,779,212 ක් වුවත් එම මස බැංකු සැසඳුම් ප්‍රකාශය සකස්	-එම-	-එම-

	කිරීමේදී මුදල් පොත අනුව ශේෂය රු.4,545,255 ක් ලෙස ගෙන තිබුණි.		
(එ)	සමාලෝචිත වර්ෂය අවසානයට රු.19,774,513 ක් වූ ප්‍රත්‍යාගණන සංචිත වටිනාකම ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව .	ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ඒ)	ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම යටතේ බඳුන් හා උපකරණ සියයට 20 බැගින් ක්ෂය කරන බව දක්වා තිබුණද එම වත්කම් කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.	-එම-	හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.
(ඔ)	වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් රු.1,464,418,928 ක් වුවද ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ එය රු.1,342,831,027 ක් ලෙස දක්වා තිබුණෙන් රු.121,587,901 ක අවිනිශ්චිත ශේෂයක් විය.	2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 15 ක ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල හා ලෙජර්වල දැක්වෙන ශේෂයන් අතර නොසැසඳු රු. 31,642,078 ක වෙනසක් විය.	පිළිතුරු ලබා දී නොමැත.	වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 ක එකතුව වූ රු.144,114,153 කට අදාලව උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	පිළිතුරු ලබා දී නොමැත.	උපලේඛන නඩත්තු කළ යුතුය.

1.7 නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති , රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති , රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ)	නිකුත් කර මාස 06 කට වැඩි කාලයක් සහිත එකතුව රු.295,550 ක් වූ චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.	අවශ්‍ය ඉදිරි ක්‍රියා මාර්ග ගන්නා බව.	යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ)	2018 දෙසැම්බර් 31 දිනැති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය	සභාව සතු ගොඩනැගිලි 55 ක් 2018 වර්ෂයෙන් පසු තක්සේරු කර නොතිබූ අතර ඉඩම් 249 ක් තක්සේරු කිරීමකින් තොරව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	වියදම් අධික බැවින් 2018 වර්ෂයෙන් පසු වෙළඳ වටිනාකම් ඇති ගොඩනැගිලි පමණක් තක්සේරු කර ඇති බව.	යොමුගත මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10 (අ) (ඇ) ඡේදය	විධිමත් අනුමැතියකින් තොරව නිවාඩු දින 30 ක් සේවය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල සභාවේ ලේකම් වෙත එකතුව රු.80,514 ක් ගෙවා තිබූ අතර ඉන් පැය 08 ආවරණය කිරීමකින් තොරව දින 08 ක් සඳහා එකතුව රු.20,778 ක් ද බැහැර ගිය දිනයක් හා වැඩ නොකළ දින 02 ක් සඳහා එකතුව රු.7,792 ක් ද ගෙවා තිබුණි.	ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියා විරහිත වන අවස්ථාවලදී පැමිණීමේ ලේඛනයෙන් පැමිණීම තහවුරු කර ගත් බව.	ආයතන සංග්‍රහයේ යොමුගත පරිච්ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.36,987,159 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ ආදායම රු.21,750,676 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තුගත ආදායම	බිල් කළ ආදායම	රැස් කළ ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
(i)	වරිපනම් හා බදු	20,157,000	27,609,007	3,247,288	1,174,054	12,701,633	12,116,195	9,314,302	7,395,121
(ii)	කුලී	11,082,000	12,856,705	13,377,087	1,837,418	6,975,000	7,607,808	5,916,308	2,353,800
(iii)	බලපත්‍ර ගාස්තු	452,000	452,000	537,000	-	2,588,000	3,175,990	3,055,690	264,218
		31,691,000	40,917,712	17,161,375	3,011,472	22,264,633	22,899,993	18,286,300	10,013,139

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) වරිපනම්		
(i) හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයට වරිපනම් හිඟය රු.7,394,988 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු,4,501,220 ක් හෙවත් සියයට 61 ක් අයකර නොතිබුණි.	හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii) වාර්ෂික බිල් කිරීම රු.24,417,076 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.7,029,342 ක් හෙවත් සියයට 29 ක් අයකර ගෙන නොතිබුණි.	-එම-	-එම-
(ආ) ව්‍යාපාර බදු හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය ආරම්භයට ව්‍යාපාර බදු ආදයම් හිඟය රු.265,200 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු,112,800 ක් හෙවත් සියයට 43 ක් අයකර නොතිබුණි.	-එම-	-එම-
(ඇ) කුලී සමාලෝචිත වර්ෂය ආරම්භයට කඩ කුලී හිඟය රු.2,357,800 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.592,475 හෙවත් සියයට 25 ක් අයකර ගෙන නොතිබුණි.	හිඟ මුදල අය කර ගැනීමට කටයුතු කරන බව.	-එම-
(ඈ) බලපත්‍ර ගාස්තු		
(i) සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු සිදු කළ ස්ථාන 04 ක් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 167 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) සභාවෙන් වෙළඳ බලපත්‍ර හා පරිසර බලපත්‍ර ලබා නොගෙන සෞඛ්‍යට අහිතකර අමු ද්‍රව්‍ය යොදා මිරිස්කුඩු නිෂ්පාදනය කිරීම නිසා පාරිභෝගික අධිකාරිය නඩු දමන ලද ව්‍යාපාරික ස්ථානයකට එරෙහිව සභාව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඉ) වෙනත් ආදායම් පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.25,015,210 ක් හා මුද්දර ගාස්තු රු.158,382,797 ක් විය.	ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලට හා උසාවිවලට ගොස් පිටපත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව.	ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂය ආරම්භයට පරිසර බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාරික ස්ථාන 09 ක් එම බලපත්‍ර ලබා නොගෙන සිටියදීත් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට සභාව විසින් වෙළඳ බලපත්‍ර ලබාදී තිබූ අතර පරිසර බලපත්‍ර ලබා නොගත් ආයතන සඳහා වෙළඳ බලපත්‍ර ලබා දීමට සපුරාලිය යුතු අවශ්‍යතා දක්වමින් ප්‍රාදේශීය සභා පනතේ 122 වගන්තිය ප්‍රකාරව අතුරු ව්‍යවස්ථා සකස් කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	අවශ්‍ය කාර්යයන් සඳහා අතුරු ව්‍යවස්ථා සැකසිය යුතුය.
(ආ)	සභාව විසින් 2022 වර්ෂය දක්වා පමණක් සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණි.	මේ වන විට 2026 දක්වා සංයුක්ත සැලැස්ම සකස් කර ඇති බව.	ඉදිරි වර්ෂ 05 සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කළ යුතුය.

3.2 අනාර්ථික ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)(i)	මතුගම ප්‍රාදේශීය සභාව විසින් 2015 හා 2018 වර්ෂවල අදියර 02 ක් ලෙස පෞද්ගලික ආයතනයකින් පිළිවෙලින් රු.1,565,000 ක් හා රු.1,855,000 ක් වූ පරිගණක මෘදුකාංග පද්ධති මිලදී ගෙන තිබුණි. පළමු අදියර යටතේ මිලදී ගෙන තිබුණු රු.95,000 ක් වූ වැටුප් සැකසීමේ පද්ධතිය සහ රු.195,000 ක් වූ පුස්තකාල කටයුතු කළමනාකරණ පද්ධතිය වෙනුවට සභාව විසින් Pay Roll පරිගණක මෘදුකාංගය හා KOHA මෘදුකාංග භාවිතා කරන අතර රු.120,000 ක් ගෙවන ලද ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කර නොතිබුණි. තවද රු.695,000 ක් සහ රු.585,000 ක් වැය කර දෙවනවර මිලදී ගෙන තිබුණු මානව සම්පත් කළමනාකරණ පද්ධතිය සහ අන්තර්ජාලය හරහා වෙන් කිරීම් පද්ධතිය ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	ලිපි ගොනු කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණුව ලබා ගැනීමට ඉල්ලීම සිදු කර ඇති බව , මානව සම්පත් කළමනාකරණ පද්ධතියට දත්ත ඇතුළත් කරමින් පවතින බව හා අන්තර්ජාලය හරහා වෙන් කිරීම් පද්ධතිය ක්‍රියාත්මක කිරීමට ඉල්ලීම් සිදු කළත් සේවාව ලැබී නොමැති බව.	මිලදී ගන්නා ලද පරිගණක මෘදුකාංග පද්ධති කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කළ යුතුය.

(ii)	අවශ්‍යතාවය හඳුනා ගැනීමෙන් තොරව රු.1,690,000 ක් වූ ඉහත පද්ධති 05 මිලදී ගැනීමට හා ගිවිසුමට පටහැනිව පුහුණුව ලබාදීමකින් තොරව එම පද්ධති 05 ට අදාලව පුහුණුවෙන් පසු ගෙවිය යුතු සියයට 25 එනම් රු.422,500 ක් ගෙවා තිබීම සම්බන්ධයෙන් 2024 දෙසැම්බර් 31 වන විටත් මුදල් රෙගුලාසි 156 පරිදි ක්‍රියා කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	සභා අරමුදලට අලාභ වන පරිදි ක්‍රියා කිරීම සම්බන්ධව යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)(i)	සභාව සතු මතුගම වත්ත ඉඩමෙන් අමාත්‍ය මණ්ඩල තීරණයක් මත විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව සභාවේ ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් එම ඉඩම පවරා ඇති බව.	ඉඩම් ප්‍රමාණය නිවැරදිව හඳුනාගෙන ඒ අනුව ඉඩම් ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතුය.
(ii)	ඉහත පරිශ්‍රයේ ලිඛිත අවසරයකින් තොරව සහ කිසිඳු කුලියක් ගෙවීමකින් තොරව පශු වෛද්‍ය කාර්යාලයක් හා නිල නිවාසයක් ඉදි කර පවත්වාගෙන යාමට එරෙහිව සභාව කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි.	මේ සම්බන්ධව සොයා බැලීමක් කර නිරවුල් කිරීමට කටයුතු කරන බව.	සභා සතු දේපල බාහිර පාර්ශව සඳහා විධිමත් පැවරීමකින් තොරව ලබා නොදිය යුතුය.
(ආ)	විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව සභාව සතු පරිශ්‍රයක 2022 වර්ෂයේ බාහිර පාර්ශව විසින් කඩ කාමර 19 ක් ඉදි කර සමාලෝචිත වර්ෂය අවසාන වනතුරුත් කුලී ගෙවීමකින් තොරව කඩ පවත්වාගෙන යාමට එරෙහිව සභාව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබූ අතර සභාවට ආදායමක් අහිමි කිරීමට කටයුතු කරන ලද පාර්ශවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	කඩ කාමර 19 සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙත ලිපි යොමු කර ඇති බව.	යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාව සතු පොදු වෙළඳපොල කඩ කාමර 09 ක් ව්‍යාපාරික කටයුතු සඳහා යොදා නොගෙන ගබඩා ලෙස භාවිතා කරන අතර මුද්‍රා තබන ලද කඩ කාමර 02 ක් සමාලෝචිත වර්ෂය තුළ ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබුණි.	කඩ කාමර 09 ක් ගබඩා ලෙස භාවිතා කරන අතර හිඟ කුලී නොගෙවීම මත කඩ කාමර 02 ක් මුද්‍රා තබා ඇති බව.	කඩ කාමර අදාල අරමුණු සඳහා උපයෝජනය කරගත යුතුය.
(ආ)	සභාව විසින් ගිවිසුම් කාලය ඉක්මවීමට පෙර කඩ කුලී ගිවිසුම් අළුත් කිරීම හෝ නැවත ටෙන්ඩර් කිරීම සිදු කළ යුතු වුවද, මතුගම පොදු	ගිවිසුම්ගතවීම සඳහා අවසන් නිවේදන නිකුත් කර ඇති බව	සභාව සතු කඩ කුලියට දීමේදී ගිවිසුම්ගත විය යුතුය.

	වෙළඳපොල කඩ 41 ක්ද, මැද මිදුල කඩ 04 ක් ද ,මාළු කඩ 06 ක්ද, වර්ෂ 06 කට අධික කාලයක සිට ගිවිසුම් අළුත් කිරීමකින් තොරව තිබුණි.	සහ එසේ නොකළහොත් පවරා ගන්නා බව.	
(ඇ)	වර්ෂ 05 කට අධික කාලයක සිට හිඟව පවතින වැලිපැන්න මෙරිල් මුණසිංහ වෙළඳ සංකීර්ණයේ කඩ කුලිය වූ රු.62,050 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද අයකර නොතිබුණි.	දිසා අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතින බව.	හිඟ කඩ කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	සභාව සතු කඩ කාමර 2022 ජුනි 06 දිනට තක්සේරු දෙපාර්මේන්තුව විසින් තක්සේරු කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය සඳහාත් තක්සේරු අගයන් මත කුලී අයකර ගැනීමට සභාව ක්‍රියා කර නොතිබුණි.	මේ වන විට ඉදිරි වර්ෂ සඳහා තක්සේරු ලබා ගැනීමට කටයුතු යොදා ඇති බව.	තක්සේරු අගයන් මත කුලී අය කළ යුතුය.
(ඉ)	සභාව සතු කඩ කාමර 89 ක් හා මාළු කඩ 11 ක් ද , වැලිපැන්න උප කාර්යාලයේ කඩ 34ක් ද සභාව සමඟ ගිවිසුම්ගත වීමකින් තොරව ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට ඉඩකඩ සලසා දී තිබුණු අතර සභාව විසින් ඔවුන්ට එරෙහිව නීතීමය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.	ගිවිසුම් ගතවන ලෙස අවසන් නිවේදන කර ඇති අතර එසේ නොකළහොත් පවරා ගැනීමට කටයුතු කරන බව.	කඩ කාමර සම්බන්ධව ගිවිසුම්ගත වී තිබිය යුතුය.

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මතුගම ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙකු විසින් සභාවේ සේවකයින් යොදවා පෞද්ගලික අවශ්‍යතා සඳහා පස් කැපීම් සම්බන්ධයෙන් බාහිර පාර්ශවයක් දැමූ නඩුවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය දක්වා සභා අරමුදලින් රු.39,000 ක් නඩු ගාස්තු ලෙස ගෙවා තිබුණු අතර සභාවේ නිලධාරීන් සිදු කරන ලද අක්‍රමිකතා මත පවරන ලද නඩු වෙනුවෙන් ගෙවන ලද නීතීඥ ගාස්තු එයට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.	සභාව සතු දේපල හා සේවකයින් වෙනුවෙන් ගෙවා ඇති බව.	නඩු ගාස්තු අදාල නිලධාරීන්ගෙන් අය කළ යුතුය.
(ආ)	2022 ඔක්තෝබර් මස සභාව සතු ජේ.සි.බී. යන්ත්‍රය ටෙන්ඩර් පටිපාටියට පටහැනිව රු.470,250 ක් වැය කර වගකීම් සහතිකයක් ලබා නොගෙන සභිකයෙකුගේ සහෝදරයෙකුගේ ගරාජයකින් අළුත්වැඩියා කර තිබුණද 2023 වර්ෂයේ නැවත අක්‍රීය වී තිබුණි. ඉහත අළුත්වැඩියාව නිසි පරිදි ඉටු කර ඇති බව ඩිපෝ ඉංජිනේරු නිර්දේශ කර තිබුණද 2023 මාර්තු එම අළුත්වැඩියාවම නැවත කිරීමට ඩිපෝ ඉංජිනේරු නිර්දේශ කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන තුරුත් බැකෝ	විමර්ශනයේ තීන්දුව ලැබෙන තුරු සිටින බව.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

යන්ත්‍රය නිශ්කාර්යව පැවති අතර සිදු වූ මූල්‍ය අලාභය සභාවට අය කර නොතිබුණි.

3.6 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව සතු අක්කර 12 රූඩ් 02 පර්චස් 36 කින් යුත් පොත් වටිනාකම රු.12,500,000 ක් වූ බටමුල්ල කන්ද ඉඩමෙන් රූඩ් 02 පර්චස් 12.72 ක් බාහිර පාර්ශ්ව විසින් භුක්ති විදීම පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව විසින් අදාල පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	එම පාර්ශවයන්ට ඉවත් වන ලෙස දැනුම්දීමට කටයුතු කරන බව.	සභාව සතු දේපල ආරක්ෂා කළ යුතුය.
(ආ)	සභාව සතු අක්කර 07 රූඩ් 01 පර්චස් 11.4 කින් යුත් පොත් වටිනාකම රු.20,000,000 ක් වූ මතුගම වත්ත ඉඩමේ සභාවේ සේවකයින් නොවන පිරිසක් විසින් අනවසර නිවාස 11 ක් ඉදිකර තිබූ අතර සභාව විසින් ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමකින් තොරව නිවෙස් හිමියන්ගෙන් වරිපනම් බදු අය කිරීම කර තිබුණි.	-එම-	-එම-
(ඇ)	2015 වර්ෂයේ දී සභාව වෙත පළාත් පාලන දෙපාර්මේන්තුවෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ස්ටියර යන්ත්‍රය සහ ජල ප්‍රවාහන ට්‍රැක්ටරය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභාව නමින් ලියාපදිංචි කර නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ගිවිසුමක් මගින් පවරා ඇති බව හා ව්‍යාපෘතියක් යටතේ ලද පරිත්‍යාගයක් වන බව.	සභාව උපයෝජනය කරන වත්කම් සභාව වෙත පවරා ගත යුතුය.
(ඈ)	සභාව විසින් භාවිතයට ගනු ලබන සුසානභූමි 72 ක් අතරින් සුසානභූමි 43 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි.	ප්‍රාදේශීය ලේකම් මගින් පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව.	සුසානභූමිවල නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගත යුතුය.
(ඉ)	ඉඩම් ලේඛනයේ ඇතුලත් ඉඩම් 42 ක අයිතිය සභාව වෙත පවරාගෙන නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	ඉඩම් අයිතිය සභාව වෙත පවරා ගත යුතුය.
(ඊ)	සභාව විසින් ප්‍රයෝජනයට ගනු ලබන තඹරුටිය ප්‍රජා ශාලාව සහ කුලී නිවාස පිහිටි පරිශ්‍රයන්හි අයිතිය මතුගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේත් කටයුතු කර නොතිබුණි.	පවරා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව.	සභාව උපයෝජනය කරන දේපල සභාව වෙත පවරා ගත යුතුය.
(උ)	2010 වර්ෂයේදී රු.5,100,000 ක් වැය කර ඉදිකරන ලද ගල්මත්ත පොදු වෙළඳසැල දෙමහල් ගොඩනැගිල්ලේ කඩ කාමර සමාලෝචිත වර්ෂය තුල කුලියට දීමකින් තොරව නිශ්කාර්යව පැවතුණි.	මෙම කඩ කාමර 2024 වර්ෂයේදී ද ටෙන්ඩර් කළ අතර ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් නොවීම මත මෙලෙස පවතින බව.	සභාව සතු වත්කම් මගින් ආදායම් උත්පාදනයට කටයුතු කළ යුතුය.

3. 7 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 , 2018 හා 2023 යන වර්ෂවල මියගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් ද, 2017 හා 2018 වර්ෂවල සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් ද අයවිය යුතු ණය ශේෂ පිළිවෙලින් රු.243,744 ක් සහ රු.147,570 ක් අතරින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේ අය කරගෙන නොතිබුණි.	ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව.	හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සභාව විසින් වර්ෂයට අදාලව පිළියෙල කළ ක්‍රියාකාරී සැලස්මේ ඇතුලත් ඇතැම් වැඩසටහන් සඳහා යෙදවීමට අපේක්ෂිත මුදල සහ එය ඉටු කිරීමට අපේක්ෂිත කාල සීමාව නිශ්චිතව දක්වා නොතිබුණි. එමෙන්ම ක්‍රියාකාරී සැලැස්මෙහි කාර්යන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය කාලීනව මැනුම් කර නොතිබූ බැවින් පාලන උපකරණයක් ලෙස ක්‍රියාකාරී සැලැස්ම යොදා ගැනීමට නොහැකි වී තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ක්‍රියාකාරී සැලැස්ම විධිමත්ව හා නිවැරදිව පිළියෙල කළ යුතුය.
(ආ)	පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂය තුල ඉටු කිරීමට අපේක්ෂිත කාර්යයන් වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් එකතුව රු.4,300,000 කට අදාල කාර්යයන් 17 ක් ඉටු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යය ඉටුකිරීමට පියවර ගත යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය වෙනුවෙන් වැය විෂයයන් 15 ක් සඳහා වෙන් කරන ලද රු.37,000 ක සිට රු.4,000,000 ක් දක්වා පරාසයකින් එකතුව රු.18,959,000 ක ප්‍රතිපාදනයන්ගෙන් සියයට 79 ක සිට සියයට 99 ක් දක්වා ප්‍රමාණයක් ඉතිරිව පැවතුණි.	වවුචර් ඉදිරිපත් නොවූ බව.	අයවැය නිවැරදි ඇස්තමේන්තු මත පිළියෙල කළ යුතුය.

4.3 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ තිරසර සංවර්ධනය සැලැස්ම තුල මූල්‍ය හා භෞතික වශයෙන් ලඟා කරගත යුතු ඉලක්ක නිවැරදිව ඇතුලත් කර නොතිබුණු අතර එහි ප්‍රගතිය කාර්තු වශයෙන් මිණුම් කර ද නොතිබුණි.	2025 වර්ෂයේදී නිවැරදිව සකස් කරන බව.	තිරසර සංවර්ධන සැලැස්ම නිවැරදිව සැකසිය යුතුය.